ඇමරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය
කොළඹ

මාධ්‍ය නිවේදනය
මහජන සම්බන්ධතා අංශය
Tel: +94 (1) 249-8100 ● Fax: +94 (1) 244-9070
Email: VanHornNT@state.gov ● http://lk.usembassy.gov

Release No. 20190425

එක්සත් ජනපද තානාපතිනිය, ජාතික සමඟියේ වැදගත්කම අවධාරණය කරයි ; එක්සත් ජනපදයෙන් ශ්‍රී ලංකාවට ලබා දී ඇති සහාය පිළිබඳ කරුණු දක්වයි

අප්‍රේල් 25, කොළඹ: ඇමරිකානු පුරවැසියන් හතරක් ඇතුළු ජීවිත 359 කට මරු කැඳවූ පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාර හමුවේ, ශ්‍රී ලාංකිකයින් සමඟිව සිටීමේ වැදගත්කම එක්සත් ජනපද තානාපතිනී අලෙයිනා බී. ටෙප්ලිට්ස් අවධාරණය කරයි. පසුගිය වසර කිහිපය තුළ, බහු ආගමික සහ ජනවාර්ගික කොටස් අතර විශ්වාසය සහ බැඳීම් ඇතිකිරීම උදෙසා ශ්‍රී ලංකාව සිදුකර ඇති ප්‍රගතිය පිළිබඳව පසක් කරන ඇය, ජාතික සමඟිය රකින මෙන් ශ්‍රී ලාංකිකයින්ගෙන් ඉල්ලා සිටියි.

"මෙම භයානක ප්‍රහාර පුද්ගලයින් කිහිප දෙනෙකුගේ ක්‍රියාවන් මිස මුළු ප්‍රජාවකගේ ක්‍රියා නොවෙයි," ටෙප්ලිට්ස් තානාපතිනිය පවසයි. "සෑම ආගමකටම සහ පසුබිමකට අයත් ශ්‍රී ලාංකිකයින් මෙම ප්‍රහාර හෙළා දැක තිබෙයි. ත්‍රස්තවාදයට එරෙහි හොඳම පිළිතුර සමඟියයි."

ටෙප්ලිට්ස් තානාපතිනිය පවසන්නේ ජනපති ට්‍රම්ප් විසින් සහාය දැක්වීමට සිදුකර ඇති ප්‍රකාශය ස්ථිර සහ වැදගත් වන බවයි. ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම පරිදි ෆෙඩරල් විමර්ෂණ කාර්යාංශයේ (FBI) විශේෂඥ නිලධාරීන් ද, එක්සත් ජනපද ඉන්දු-ශාන්තිකර බලඝණයේ (USINDOPACOM) විශේෂඥ කණ්ඩායමක් ද පසුගිය ඉරිදා සිදුවූ ත්‍රස්ත ප්‍රහාර පිළිබඳ සිදුකරන පරීක්ෂණ වලට, තම සහාය ලබාදෙමින් පවතියි. මෙම නිලධාරීන්, ලාංකික නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනවල නිලධාරීන් සමඟ එක්ව අපරාධ සහ රස පරීක්ෂණ කටයුතු වල නිරත වෙයි. ප්‍රජාවන්ට අත්‍යාවශ්‍ය අවශ්‍යතා පිළිබඳව සොයා බැලීමටද තානාපති කාර්යාලය පියවර ගෙන ඇත. මෙම ඛේදවාචකයට පසුව ලාංකික ප්‍රජාවන්ට එක්ව කටයුතු කිරීමේ අවස්ථාවන් උදෙසා සහය දීමට හැකි ආකාර පිළිබඳව තානාපති කාර්යාලය සොයා බලමින් සිටියි.

"මේ අවස්ථාවේ ශ්‍රී ලංකාවට අවශ්‍ය සෑම සහායක්ම ලබා දීමට එක්සත් ජනපදය කැප වන අතර මෙම සහායන් ලබාදෙන්නේ ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම මතයි," තානාපතිනිය පවසයි. "මෙම ලබාදෙන සහායන් වලට එක්සත් ජනපද හමුදා සහභාගී වීම, කුමන්ත්‍රණ න්‍යායන් ලෙස අර්ථ දැක්වීමෙන් සිදුවන්නේ, මෙම ප්‍රහාරයට ගොදුරු වූ පවුල් සහ ප්‍රජාවන් වෙතට යොමු විය යුතු අවධානය වෙනතකට යොමු වීමයි." මෙම සහයෝගීතාව එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව අතර වර්ධනය වෙමින් පවතින හවුල්කාරිත්වයේ කොටසකි. ආරක්ෂාව එම හවුල්කාරිත්වයේ ප්‍රධාන අංශයකි. "ශ්‍රී ලංකාවේ සමීප මිතුරෙක් ලෙස අපි මේ ත්‍රස්ත ක්‍රියා නිසා

සිත් වේදනාවට පත්ව සිටිමු. මෙම අර්බුදය තුළින් පෙරටත් වඩා ශක්තිමත්ව සහ එක්ව නැගී සිටීමට ශ්‍රී ලංකාවට සහය දීමට අපි කැප වන්නෙමු."

###